# බදුකරණය හැඳින්වීම

## ප්‍රාථමික කාර්ය සහ වියදම් පියවා ගැනීම

රජයක් රටක ආර්ථික කටයුතු සඳහා දයක වීමේදී ප්‍රාග්ධන සහ අයභාර වියදම් දැරීම අනිවාර්ය වේ. මෙම වියදම් පියවා ගැනීමට රජය ආදායම් උපයාගන්නා ප්‍රධාන මාර්ගය වන්නේ බදු ආදායමයි. රාජ්‍ය වියදම් සඳහා අරමුදල් රැස්කිරීම බදුකරණයේ **ප්‍රාථමික කාර්ය** ලෙස හඳුන්වයි.

# රාජ්‍ය වියදම් (Public Expenditure)

### ආරක්ෂාව සහ නීතිය

පොලිසිය සහ හමුදාව මගින් සපයන ආරක්ෂාව සහ සාමය පවත්වා ගැනීම.

### නිදහස් අධ්‍යාපනය

රජයේ පාසල් සහ විශ්වවිද්‍යාල මගින් සපයන අධ්‍යාපන සේවා.

### සෞඛ්‍ය සේවා

රජයේ රෝහල් මගින් සපයන නිදහස් වෛද්‍ය සේවා සහ ප්‍රතිකාර.

* මීට අමතරව මාර්ග පද්ධති නඩත්තුව, විදුලිය සහ ජලය සහනදායී මිලට සැපයීම සිදු කරයි.

# බදුකරණයේ ආර්ථික කාර්යයන්

## ආයෝජන මෙහෙයවීම

දේශීය හෝ විදේශීය ආයෝජන ගලා යා යුතු දිශාවන් සහ ප්‍රමුඛතා තීරණය කිරීම සඳහා බදු ප්‍රතිපත්ති භාවිතා කරයි.

## පෞද්ගලික අංශය දිරිගැන්වීම

බදු අනුපාත සහ දිරි දීමනා හරහා පෞද්ගලික ආයෝජන දිරිගැන්වීම හෝ අධෛර්යමත් කිරීම සිදු කරයි.

## දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම

විදේශීය තරඟකරුවන්ගෙන් දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීමට ආනයන බදු වැනි මූල්‍ය මෙවලම් භාවිතා කරයි.

# බදුකරණයේ සමාජයීය කාර්යයන්

## අධෛර්යමත් කිරීම

මත්පැන්, දුම්වැටි සහ සූදුව වැනි අනුමත නොකරන කාර්යයන් සීමා කිරීමට ඉහළ බදු යොදා ගැනීම.

## දිරිගැන්වීම

ඉතිරි කිරීම්, විශ්‍රාමික ආයෝජන සහ පර්යේෂණ (R&D) කටයුතු දිරිගැන්වීම සඳහා බදු සහන ලබා දීම.

## ආදායම් පරතරය අඩු කිරීම

සමාජයේ ආදායම් අසමතුලිතතාවය අඩු කිරීමට බදු සහන සහ **වර්ධන (Progressive)** බදු ප්‍රතිශත භාවිතා කිරීම මගින් සාධාරණත්වය තහවුරු කරයි.

# බදුකරණයේ මූලධර්ම (Principles)

- **සාධාරණත්වය:** ගෙවීමේ හැකියාව මත පදනම් වීම.
- **අවම පිරිවැය:** රැස්කිරීමේ පිරිවැය අවම වීම.
- **ප්‍රමාණවත් බව:** රාජ්‍ය වියදම් පියවීමට සැහීම.
- **පුළුල් පරාසයක්:** විවිධ කොටස් ආවරණය වීම.
- **ප්‍රගතිශීලී බව:** වැඩි ආදායම්ලාභීන්ගෙන් වැඩි බදු අය කිරීම.
- **නිශ්චිත බව:** මුදල, දිනය සහ ක්‍රමය පැහැදිලි වීම.
- **සරල බව:** තේරුම් ගැනීමට පහසු වීම.

# ශ්‍රී ලංකාවේ බදු අධිකාරීන් සහ බදු වර්ග


| අධිකාරිය | ප්‍රධාන බදු වර්ග |
| --- | --- |
| **දේශීය ආදායම් (IRD)** | ආදායම් බද්ද (IT), එකතු කළ අගය මත බද්ද (VAT), මුද්දර බද්ද (2006 අංක 12) |
| **පළාත් ආදායම්** | මුද්දර බද්ද (1982 අංක 43), ඔට්ටු ඇල්ලීම, ලොතරැයි, බනිජ බදු |
| **රේගු (Customs)** | ආනයන සහ අපනයන බදු පරිපාලනය සහ අධීක්ෂණය |
| **සුරා බදු (Excise)** | මත්පැන් හා දුම්කොළ බදු එකතු කිරීම සහ ආඥා පනත් බලාත්මක කිරීම |

# වාසික නීතිය (69 වගන්තිය)

## වාසික බව තීරණය කරන රීතීන්:

- ශ්‍රී ලංකාව තුළ වාසය කිරීම.
- මාස 12ක් තුළ දින 183ක් හෝ වැඩි කාලයක් සිටීම.
- ශ්‍රී ලංකා රජයේ සේවකයකු හෝ නිලධරයකු වීම.
- ශ්‍රී ලංකා නෞකාවක සේවය කිරීම.

වාසික තැනැත්තා "ගෝලීය ආදායම" මත බදු ගෙවිය යුතුය.



# බදු පාලනයේ වැදගත්කම (Governance)

### අනුකූලතාව

නීතිවලට අනුගත වීම සහ දඩුවම් අවම කිරීම.

### සදාචාරය

අවංක බව සහ විනිවිදභාවය තහවුරු කිරීම.

### අවදානම

මූල්‍ය සහ කීර්ති නාමයට වන හානි වැළැක්වීම.

### විශ්වාසය

ආයෝජකයින්ට විනිවිදභාවය තහවුරු කිරීම.

### උපායමාර්ග

ව්‍යාපාරික තීරණ සමඟ බදු ඒකාබද්ධ කිරීම.

### ගෝලීය නීති

OECD, BEPS වැනි ප්‍රමිතීන්ට අනුකූල වීම.

# ඩිජිටල් බදුකරණය සහ අභියෝග




- බදු අය කළ හැකි පැවැත්ම (PE) තීරණය කිරීමේ අපහසුව.
- අස්පෘෂ්‍ය වටිනාකම තක්සේරු කිරීමේ සංකීර්ණතාව.
- ද්විත්ව බදුකරණයේ අවදානම.
- පරිශීලක දත්ත වල අගය ප්‍රමාණනය කිරීම.

ප්‍රතිචාර: ඒකපාර්ශ්වීය (DST) සහ බහුපාර්ශ්වික (ගෝලීය අවම බදු) පියවර.

# ශ්‍රී ලංකාවේ ඩිජිටල් සේවා බදුකරණය

## VAT සංශෝධනය (2025 අංක 04 පනත)

අනේවාසික පුද්ගලයින් විද්‍යුත් වේදිකා හරහා සපයන සේවා සඳහා VAT හඳුන්වා දීම.

**ක්‍රියාත්මක වීම: 2026 අප්‍රේල් 01**

## ආදායම් බදු වෙනස්කම්

විදේශයන්හි සිට කරන සේවාවන් සඳහා පෙර පැවති නිදහස් කිරීම් 2025 අප්‍රේල් 01 සිට ඉවත් කර ඇත.

**නව බදු අනුපාතය: 15%**